ශ්‍රී ලංකා මහ බැංකුව
இலங்கை மத்திய வங்கி
CENTRAL BANK OF SRI LANKA

ජ්‍යේෂ්ඨ ආරක්ෂක සේවා පාලක තනතුර - මෙහෙයුම් (කොන්ත්‍රාත් පදනම මත)



ආරක්ෂක සේවා දෙපාර්තමේන්තුව

ශ්‍රී ලංකා මහ බැංකුවේ ජ්‍යේෂ්ඨ ආරක්ෂක සේවා පාලක - මෙහෙයුම් තනතුරේ සේවය කිරීම සඳහා කොන්ත්‍රාත් පදනම යටතේ බඳවා ගැනීමට සලකා බැලීම සඳහා ත්‍රිවිධ හමුදාවේ හෝ පොලිස් විශේෂ කාර්ය බලකායේ නිත්‍ය සේවයේ රාජකාරි කරන ලද, පහත අවශ්‍යතා සපුරා ඇති, සුදුසුකම්ලත් මනා පළපුරුද්දක් සහිත ශ්‍රී ලාංකික පුරවැසියන්ගෙන් අයදුම්පත් කැඳවනු ලැබේ.

1.0 කාර්යය/වගකීම් :

- ශ්‍රී ලංකා මහ බැංකුවේ සියලු පරිශ්‍රයන් තුළ සේවකයින්, අමුත්තන් සහ වත්කම් සඳහා ආරක්ෂිත සහ සුරක්ෂිත පරිසරයක් සහතික කිරීම සඳහා ත්‍රිත්ව ආරක්ෂක පද්ධතියෙහි (three-layer security system) සියලුම ආරක්ෂක මෙහෙයුම් නිරීක්ෂණය සහ අධීක්ෂණය කිරීම.
- ශ්‍රී ලංකා මහ බැංකුව තුළ විශ්වාසදායක සහ අඛණ්ඩ ආරක්ෂක මෙහෙයුම් සහතික කිරීම සඳහා, ආරක්ෂක උපකරණවල නඩත්තුව සහ ඒවායේ ක්‍රියාකාරිත්වය අධීක්ෂණය කිරීම.
- ආයතනික අවශ්‍යතා සහ ප්‍රමිතීන්ට අනුකූලවීම සහ කාර්යක්ෂමතාව තහවුරු කිරීම සඳහා, අභ්‍යන්තර සහ බාහිර ආරක්ෂක කාර්ය මණ්ඩලයේ මානව සම්පත් සහ ආරක්ෂාව සම්බන්ධ කටයුතු කළමනාකරණය කිරීම.
- ආරක්ෂක නිලධාරීන්ගේ සහ කාර්ය මණ්ඩලයේ සුදානම මෙන්ම සමස්ත ආරක්ෂක විධිවිධානවල කාර්යක්ෂමතාව ඉහළ නැංවීම සඳහා, දෙපාර්තමේන්තුවේ මානව සම්පත්වල නිපුණතා ශක්තිමත් කිරීම සහ කුසලතා සංවර්ධන වැඩසටහන් සඳහා දායක වීම.
- ශ්‍රී ලංකා මහ බැංකුව තුළ ස්ථාවර සහ ඵලදායී ආරක්ෂාවක් සහතික කිරීම සඳහා ආරක්ෂක සේවා ප්‍රමිතීන් අධීක්ෂණය කිරීම සහ පවත්වාගෙන යාම.
- ආරක්ෂක මෙහෙයුම්වල භාවිතය ප්‍රශස්ත කිරීම සහ ඵලදායීතාව වර්ධනය කිරීම සඳහා නව තාක්ෂණය යොදාගැනීම සහ ඒකාබද්ධ කිරීම.
- කුසලතා සංවර්ධන වැඩසටහන් සඳහා දායක වීම ඇතුළු විශේෂිත දෙපාර්තමේන්තු පැවරුම් ක්‍රියාත්මක කිරීම සහ දෙපාර්තමේන්තුවේ මෙහෙයුම් සහ ආයතනික අරමුණු සාක්ෂාත් කර ගැනීමට සහාය වීම සඳහා කළමනාකාරිත්වය විසින් පවරනු ලබන වෙනත් ඕනෑම කාර්යයක් ඉටු කිරීම.

2.0 අවශ්‍ය අවම සුදුසුකම් හා පළපුරුද්ද :

2.1 අධ්‍යාපන සුදුසුකම් :

- ශ්‍රී ලංකා විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව විසින් පිළිගත් දේශීය හෝ විදේශීය විශ්වවිද්‍යාලයකින් ලබාගත් ඕනෑම විෂය ක්ෂේත්‍රයක ප්‍රථම උපාධියක් හෝ පශ්චාත් උපාධියක්.

2.2 වයස :

- 2026.11.23 දිනට අවුරුදු 40ට නොඅඩු සහ අවුරුදු 55ට නොවැඩි විය යුතු ය.

2.3 පළපුරුද්ද :

- අවම වශයෙන් අවුරුදු 22ක කාලයක් ත්‍රිවිධ හමුදාවේ හෝ ශ්‍රී ලංකා පොලිස් විශේෂ කාර්ය බලකායේ නිත්‍ය සේවයේ නිකැළැල් අඛණ්ඩ සේවයක් සපුරා තිබීම.
- රෙජිමේන්තු, පාබල හමුදා, බෝම්බ නිෂ්ක්‍රීය කිරීම, විනයාරක්ෂක, මාණ්ඩලික සේවය, විශේෂ කාර්ය බලකා, අවි ආයුධ හෝ ශාරීරික පුහුණු උපදේශක හෝ ගිනි ආරක්ෂක වැනි ක්ෂේත්‍රවල විශේෂඥතාව අමතර සුදුසුකමක් ලෙස සලකනු ලැබේ.

2.4 ත්‍රිවිධ හමුදාවේ / ශ්‍රී ලංකා පොලිස් විශේෂ කාර්ය බලකායේ දැරූ නිලය :

- ශ්‍රී ලංකා යුද හමුදාවේ ලුතිනන් කර්නල් (Lieutenant Colonel), ශ්‍රී ලංකා නාවික හමුදාවේ කමාන්ඩර් (Commander), ශ්‍රී ලංකා ගුවන් හමුදාවේ වින්ග් කමාන්ඩර් (Wing Commander) හෝ ඊට ඉහළ නිලයක් දැරූ හෝ ශ්‍රී ලංකා පොලිස් විශේෂ කාර්ය බලකායේ ජ්‍යේෂ්ඨ පොලිස් අධිකාරී (Senior Superintendent - SSP) හෝ ඊට ඉහළ නිලයක් දැරූ විශ්‍රාමික නිලධාරීන්.

2.5 වෙනත් සුදුසුකම් :

- රටේ ඕනෑ ම ප්‍රදේශයක ඕනෑම ක්ෂේත්‍ර රාජකාරියක් ඉටු කිරීම සඳහා වෛද්‍යමය වශයෙන්, ශාරීරික ව සහ මානසික ව යෝග්‍ය විය යුතු ය.

3.0 සේවා නියුක්තිය :

- වසර තුනකට (03) නොවැඩි කාලයක් සඳහා කොන්ත්‍රාත් පදනම මත බඳවා ගැනේ.
- කොන්ත්‍රාත් පදනම මත බඳවා ගනු ලබන නිලධාරීන් ශ්‍රී ලංකා මහ බැංකුවේ ස්ථිර සේවයට අන්තර්ග්‍රහණය කරනු නොලැබේ.

4.0 වැටුප් සහ වෙනත් ප්‍රතිලාභ :

- ආකර්ෂණීය දීමනාවක් (බදු ගෙවිය යුතු) සමඟ සේවක අර්ථසාධක අරමුදල (EPF) සහ සේවා නියුක්තයන්ගේ භාර අරමුදල (ETF) සඳහා දායකත්වය සහ වෛද්‍ය ප්‍රතිලාභ

තෝරා ගැනීමේ ක්‍රමවේදය

නියමිත අවම සුදුසුකම් සපුරාලන අයදුම්කරුවන් පමණක් ඉදිරි ඇගයීම් සඳහා කෙටි ලැයිස්තුගත (Shortlist) කරනු ලබන අතර, එම ඇගයීම්වලට ලිඛිත විභාගයක්/ඇගයීමක්, වෛද්‍ය පරීක්ෂණයක් සහ සම්මුඛ පරීක්ෂණ එකක් හෝ කිහිපයක් ඇතුළත් විය හැකිය.

අයදුම්පත්

අවශ්‍ය සුදුසුකම් සහ පළපුරුද්ද සපුරා ඇති, ඉහත තනතුර සඳහා අයදුම් කිරීමට අපේක්ෂා කරන ශ්‍රී ලාංකික පුරවැසියන් 2026.11.23 වන දින හෝ ඊට පෙර පහත සබැඳිය ඔස්සේ පමණක් අයදුම්පත් ඉදිරිපත් කළ යුතුය.

සබැඳිය - **https://www.cbsl.gov.lk/en/careers**

අයදුම්පත් ඉදිරිපත් කිරීමේ දී, ඉහත සබැඳියෙහි සඳහන් කර ඇති නියමයන් සහ කොන්දේසිවලට අනුගත වන ලෙස අයදුම්කරුවන්ට උපදෙස් දෙනු ලැබේ.

අයදුම්පත් භාරගන්නා අවසන් දිනයට අදාළ සුදුසුකම් සහ පළපුරුද්ද සපුරා නොමැති අයදුම්කරුවන් මෙම තනතුර සඳහා අයදුම් කිරීමට සුදුසුකම් නොලබයි. අදාළ සුදුසුකම් සපුරා නොමැති හෝ අවසන් දිනයට පසුව ලැබෙන හෝ නියමිත ආකෘතියට අනුකූල නොවන අයදුම්පත් කිසිදු දැනුම්දීමකින් තොරව ප්‍රතික්ෂේප කරනු ලැබේ.

අයදුම්කරුවන් විසින් ඉහත තනතුර සඳහා අදාළ වන සුදුසුකම් සපුරාලීම තහවුරු කිරීම පිණිස අධ්‍යාපන / වෘත්තීය සුදුසුකම්, සේවා පළපුරුද්ද තහවුරු කරන ලියකියවිලිවල ස්කෑන් කරන ලද පිටපත් උඩුගත (upload) කළ යුතුය.
(උප්පැන්න සහතිකය, ජාතික හැඳුනුම්පත, උපාධි සහතිකපත් / ප්‍රතිඵල ලේඛන (Transcripts), ත්‍රිවිධ හමුදාවේ සේවා සහතික පොත / ශ්‍රී ලංකා පොලිසියෙන් නිකුත් කරනු ලබන සේවා සහතික, අනෙකුත් සුදුසුකම්වලට අදාළ සහතිකපත් සහ අනෙකුත් අදාළ ලේඛන)

සම්මුඛ පරීක්ෂණයට පෙර පැවැත්වෙන සහතිකපත් පරීක්ෂා කිරීමේදී අදාළ සහතිකපත්වල සහ ලියකියවිලිවල මුල් පිටපත් ඉදිරිපත් කිරීමට අපොහොසත් වන අයදුම්කරුවන් කිසිදු ආකාරයකින් තනතුර සඳහා අයදුම් කිරීමට සුදුසුකම්ලත් අයදුම්කරුවන් ලෙස නොසැලකේ.

තෝරා ගැනීම සඳහා කුමන ආකාරයකින් හෝ බලපෑම් කිරීම හෝ එසේ කිරීමට තැත් කිරීම බඳවා ගැනීම සඳහා නුසුදුසුකමක් වේ. බඳවා ගනු ලබන සංඛ්‍යාව තීරණය කිරීමේ, බඳවා ගැනීමේ ක්‍රියාවලිය කල් දැමීමේ හෝ අවලංගු කිරීමේ අයිතිය ශ්‍රී ලංකා මහ බැංකුව සතු වේ. බඳවා ගැනීමේ ක්‍රියාවලියේ ඕළඟ පියවර සඳහා සම්බන්ධ කරගනු ලබන්නේ කෙටි ලැයිස්තුගත කරන ලද අයදුම්කරුවන් පමණි.

2023 අංක 16 දරන ශ්‍රී ලංකා මහ බැංකු පනතේ විධිවිධාන, තෝරාගනු ලබන සියලුම අපේක්ෂකයින් සඳහා අදාළ වේ.

අධ්‍යක්ෂ - මානව සම්පත්
ශ්‍රී ලංකා මහ බැංකුව, අංක. 30, ජනාධිපති මාවත, කොළඹ 01.
දු.ක - 011-2477330 ෆැක්ස් - 011-2477715

Gazette.lk AMBITIONS REALIZED